ආරක්ෂක රාජ්‍ය අමාත්‍යංශය

රණවිරු සේවා අධිකාරිය

පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර සහකාර අධ්‍යක්ෂ(මූල්‍ය) (01)

01) අවශ්‍ය සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් විෂයයන්ගෙන් එකක් පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් මූලික උපාධියක්

ආර්ථිකවිද්‍යාව,සමාජවිද්‍යාව,දර්ශනය,දේශපාලනවිද්‍යාව,වාණිජ්‍යය,සංවර්ධන සැලසුම්,ව්‍යාපාර පරිපාලනය,භූගෝල විද්‍යාව,කෘෂිකර්මය,සංඛ්‍යානය,විද්‍යාව,

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, සංස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02) රැකියා විස්තරය

රණවිරු සේවා අධිකාරියේ සියළුම මූල්‍ය කටයුතු

03) වැටුප් පරිමාණය

MM-1-1 Rs. 53,175 - 10 x1375 - 15x1910 - 95,575/=

(2016-01-01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 හි ප්‍රතිපාදන අනුව මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020-01-01 දින සිටය.)

04) වයස :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 22 ට නොඅඩු හා අවු :45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

05) ලිඛිත පරීක්ෂණය **:-** අයදුම්කරුවන් පහත සඳහන් විෂයන්ට අදාලව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

1. භාෂා ප්‍රවීනතාවය
2. අභියෝග්‍යතා පරීක්ෂණය

06) බඳවා ගැනීමේ ක්‍රමවේදය **:-** ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව තනතුර සඳහා සුදුසු අයදුම්කරුවකු තෝරා ගැනේ.

තනතුර ගිණුම් නිළධාරී(02)

01)**අවශ්‍ය සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් වාණිජ්‍යය හෝ ගිණුම්කරණය පිළිබඳ මූලික උපාධියක් හෝ ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම

සහ

උපාධිය හෝ ඩිප්ලෝමාව ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, සංස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසරක පළපුරුද්ද

හෝ

ICA,CIMA,ACCA පිළිබඳ අන්තර් මධ්‍ය සහතිකය ලබා ගැනීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක , සංස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසරක පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02) රැකියා විස්තරය

රණවිරු සේවා අධිකාරියේ සියළුම ගිණුම් කටයුතු වලදී සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ(මූල්‍ය) වෙත සහය වීම.

03)වැටුප් පරිමාණය :-

JM-1-1 Rs.42,600 - 10x755 - 18x1,135 - 70,580/=

(2016-01-01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 හි ප්‍රතිපාදන අනුව මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020-01-01 දින සිටය.)

04) වයස :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 22 ට නොඅඩු හා අවු :45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

05) ලිඛිත පරීක්ෂණය :- අයදුම්කරුවන් පහත සඳහන් විෂයන්ට අදාලව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

1. භාෂා ප්‍රවීනතාවය
2. අභියෝග්‍යතා පරීක්ෂණය
3. තනතුරට අදාල විෂයයන් පිළිබඳ දැනුම

06) බඳවා ගැනීමේ ක්‍රමවේදය **:-** ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව තනතුර සඳහා සුදුසු අයදුම්කරුවකු තෝරා ගැනේ.

තනතුර පද්ධති විශ්ලේෂක (01)

01) **අවශ්‍ය සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික උපාධියක් හා උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක,රාජ්‍ය සංස්ථාවක, සංස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

අධිකාරියේ කළමනාකරණ සහකාර(තාක්ෂණික/කාර්මික) කාණ්ඩයේ II ශ්‍රේණියේ තොරතුරු තාක්ෂණ සහකාර තනතුරක අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02) රැකියා විස්තරය

අධිකාරියේ දත්ත පද්ධතිය නිර්මාණය කිරීම,වැඩි දියුණු කිරීම හා පවත්වාගෙන යාම.

03) වැටුප් පරිමාණය

JM-1-1Rs. 42,600 - 10x755 - 18x1,135 - 70,580/=

(2016-01-01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 හි ප්‍රතිපාදන අනුව මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020-01-01 දින සිටය.)

04) වයස **:-** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

05) ලිඛිත පරීක්ෂණය **:-** අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන්ට අදාලව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

1. භාෂා ප්‍රවීනතාවය
2. අභියෝග්‍යතා පරීක්ෂණය
3. තනතුරට අදාල විෂයයන් පිළිබඳ දැනුම

06) බඳවා ගැනීමේ ක්‍රමවේදය :- ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව තනතුර සඳහා සුදුසු අයෙකු බඳවා ගනු ලැබේ.

තනතුර වැඩසටහන් නිලධාරී (10)

01) අවශ්‍ය සුදුසුකම්-

රැකියා විස්තරයන්ට අදාලව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් ලබා තිබීම.

02) රැකියා විස්තරය

රණවිරු සේවා අධිකාරියේ වැඩ කටයුතු අදාල දිස්ත්‍රික්ක වල සිට ප්‍රධාන කාර්යාලය හා එක්ව ක්‍රියාත්මක කිරීම.

03) වැටුප් පරිමාණය -

MA3- Rs. 32,200 - 10 x445 - 11x660 - 10x730 - 5x750 - 54,960

(2016-01-01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 හි ප්‍රතිපාදන අනුව මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020-01-01 දින සිටය.)

04) වයස **:-** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු.18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

05) ලිඛිත පරීක්ෂණය**:-**අයදුම්කරුවන් සඳහා පහත සඳහන් විෂයයන්ට අදාලව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

i) භාෂා ප්‍රවීනතාව

ii) අභියෝග්‍යතා පරීක්ෂණය

iii) තනතුරට අදාල විෂයන් පිළිබඳ දැනුම

06) බඳවා ගැනීමේ ක්‍රමවේදය **:-**ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට භාජනය කිරීමෙන් අනතරුව තනතුර සඳහා සුදුසු අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

තනතුර තොරතුරු තාක්ෂණ සහකාර (02)

01) **අවශ්‍ය සුදුසුකම්**

අධ්‍යාපන-

අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ ,ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළු විෂයන් හතරකට (04) කට සම්මාන සමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයක් සමත්වීම.

ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් පොදු ප්‍රශ්න පත්‍රය හැර තෘතීය අධ්‍යාපනය හැදෑරීම සඳහා අවශ්‍ය කරන විෂයයන් ගණන සමත් වීම මගින් ඒ සඳහා වන කාර්ය සාධන මට්ටම ලබා තිබීම.

වෘත්තීය සුදුසුකම්

අදාල ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික පුහුණු කිරීම් ආයතනයක් වෙතින් NVQ 5 වන මට්ටම ට වඩා පහළ නොවන ඩිප්ලෝමා හෝ සහතිකපත්‍ර පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

02) රැකියා විස්තරය :-

යෙදුම් මෘදුකාංග හා දත්ත පද්ධතියට අදාල කටයුතු නඩත්තුව හා පවත්වාගෙන යාම.

03) වැටුප් පරිමාණය **:-**

MA-2-1 Rs.30,310 - 10x300 -7x350 -4x495 -20x660 - 50,940

(2016-01-01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 හි ප්‍රතිපාදන අනුව මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020-01-01 දින සිටය.)

04) වයස :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

05) ලිඛිත පරීක්ෂණය :- අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන්ට අදාලව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

1. භාෂා ප්‍රවීනතාවය
2. අභියෝග්‍යතා පරීක්ෂණය
3. තනතුරට අදාල විෂය පිළිබඳ දැනීම

06) බඳවා ගැනීමේ ක්‍රමවේදය :-

ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව තනතුර සඳහා සුදුසු අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

තනතුර කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන)(03)

01) **අවශ්‍ය සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන්

අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ ,ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයක් සමත්වීම.

ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් තුනක් සමත් වීම. (පොදු ප්‍රශ්න පත්‍රය හැර)

අභ්‍යන්තර අයදුම්කරුවන්

අධිකාරියේ ප්‍රාථමික කාණ්ඩයේ පුහුණු හෝ නුපුහුණු පහත සඳහන් සුදුසුකම් ඇති සේවකයින් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

අ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් සමත්වීම

ආ. වසර 5ක ස්ථිර සේවා කාලයක් සනාථ කර තිබිය යුතුය.

(අනියම් හෝ තාවකාලික සේවා කාලයන් ගණන් ගනු නොලැබේ.)

02) රැකියා විස්තරය **:-**

ප්‍රලේඛනය,වාර්තාකරණය හා සන්නිවේදනය

03) වැටුප් පරිමාණය :-

MA-1-1 රු. 27,910 - 10x300 - 7x350 - 4x495 -20x660 - 48,540

(2016-01-01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 හි ප්‍රතිපාදන අනුව මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020-01-01 දින සිටය.)

04) වයස **:-** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු හා අවු :45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

05) ලිඛිත පරීක්ෂණය **:-** අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන්ට අදාලව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

1. භාෂා ප්‍රවීනතාවය
2. අභියෝග්‍යතා පරීක්ෂණය
3. පරිගණක භාවිතය පරීක්ෂණය

06) බඳවා ගැනීමේ ක්‍රමවේදය :- ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව තනතුර සඳහා සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

තනතුර රියැදුරු (01)

01) **අවශ්‍ය සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන්

අ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 02 ක්වත් සමත්වීම.

ඇ)වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් සහ රාජ්‍ය සංස්ථාවක, සංස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක බර වාහන ධාවනය කිරීමට අදාලව අවම වශයෙන් වසර තුනක පසුකාලීන පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් දෙකක්වත් සමත්වීම.

ඇ)බර වාහන රියැදුරු බලපත්‍රයක් ලබා තිබීම හා රියැදුරු කාර්යයෙහි අවම වශයෙන් වසර තුනක පසුකාලීන පළපුරුද්ද.

02) රැකියා විස්තරය :-

අධිකාරියේ රියැදුරු රාජකාරි,වාහන නඩත්තුව හා ධාවන සටහන් පවත්වාගෙන යාම.

03) වැටුප් පරිමාණය:-

PL-3 26,290 - 10x270 - 10 x 300 - 10x330 - 12x350 - 39,490

(2016-01-01 දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 හි ප්‍රතිපාදන අනුව මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020-01-01 දින සිටය.)

04) වයස:- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු හා අවු :45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

05) බඳවා ගැනීමේ ක්‍රමවේදය :- ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව තනතුර සඳහා සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

❖ සෑම අයදුම්කරුවෙකුම

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරේ වගකීම් දැරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් සහිත විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

සියළු තනතුරු වල ස්වාභාවය : මෙම තනතුරු ස්ථිරය. සේවක ආර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක විය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කිරීම : අයදුම්කරුවන්, ජීව දත්ත ඇතුලත්ව නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික වල සහතික කරන ලද පිටපත් සමඟ ශ්‍රාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් හා දුරකතන අංක සහිතව 2019.06.17 දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය/අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් අදාල ආයතනයේ ප්‍රධානියා මගින් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම් කෙලවරේ අයදුම් කරනු ලබන තනතුර අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.

සභාපති,
රණවිරු සේවා අධිකාරිය
නො. 449 ගාලුපාර
කොළඹ 03